**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2013**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2008 අංක 35 දරන සමුද්‍රීය පරිසර දූෂණ ආරක්ෂණ පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මගේ විගණනය මත පදනම් වූ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිත වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටීන් සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 02. මූල්‍ය ප්‍රකාශන

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මු.රෙ 757 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| ii. මු.රෙ 104 (i) | දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලබාදුන් රු.17,700 ක අත්තිකාරම් මුදල් වංචා කිරීමක් වාර්තාවී ඇති නමුත් ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් නිශ්චය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**03. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,804,789 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,814,711 ක් වුයෙන් පෙර වර්ෂය සමඟ සැසඳිමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.990,078 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඌනතාවය පෙර වර්ෂය හා සැසදීමේදී සියයට 54.56 කින් වැඩිවී තිබුණි. මේ සඳහා මුළු ආදායම් රු.මිලියන 1.17 කින් වැඩි වීම හා මෙහෙයුම් වියදම් රු. මිලියන 2.16 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

ඉකුත් වර්ෂය හා සාපේක්ෂව සැලකීමේදී ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළ අතර මෙයට ප්‍රධාන වශයෙන් මුදල් ශේෂය හා තොග ශේෂය වැඩිවීම බලපා තිබුණි.

**04. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ප්‍රතිපාදනය රු.45,000,000 ක් විය. මෙම ක්‍රියාකාරි සැලැස්ම සමාලෝචිත වර්ෂය තුළදී සංශෝධනය කර තිබූ අතර ප්‍රගති වාර්තා අනුව වර්ෂයේ තථ්‍ය වියදම රු.17,094,096 ක් විය.

(ආ) ක්‍රියාකාරි සැලැස්ම තුළ ඇතුළත් වූ ක්‍රියාකාරකම් 46 න් රු. 6,800,000 ක් වෙන්කර තිබූ ක්‍රියාකාරකම් 02 ක් අවලංගුකර තිබූ අතර, ක්‍රියාකාරකම් 10 කට අදාල මුළු ප්‍රතිපාදනය වූ රු. 12,440,000 ක් ඉතිරිවී තිබුණි. මෙයට අතිරේකව ක්‍රියාකාරකම් 20 ක රු.21,617,000 ක් වූ ප්‍රතිපාදන මුදලින් සියයට 50 කට වඩා ඉතිරිවී තිබුණි. මේ අනුව ක්‍රියාකාරි සැලැස්මට අනුව සැලසුම්ගත කාර්යයන් ඉටුවී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ක්‍රියාකාරි සැලැස්ම 2013 සැප්තැම්බර් මාසය තුළ සංශෝධනය කර තිබූ අතර එහිදී ක්‍රියාකාරි සැලැස්ම තුළ වූ ක්‍රියාකාරකම් 08 ක ප්‍රතිපාදන අඩුකර ක්‍රියාකාරකම් 04 ක් සඳහා එම ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. ඉන් රු. 14,069,700 ක් වූ ක්‍රියාකාරකම් 03 ක ප්‍රතිපාදන මුදල් ඉතිරිවී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**----------------------------------------**

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ, 2012 අංක 01 දරන නියෝග අනුව තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම සමුද්‍ර ආරක්ෂණ අධිකාරිය මඟින් අනුමත කර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. හදිසි තෙල් විසිරීමකදී ආයතන සම්බන්ධ වගකීම අධිකාරියෙන් බැහැරව පැවතුණි. මේ පිළිබඳ කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 අගෝස්තු 23 වන දින MV.Thermopylae Sierra නෞකාව මඟින් සිදුවූ තෙල් කාන්දුවීම සම්බන්ධයෙන් දරන ලද සියළු වියදම් අමාත්‍යමණ්ඩලය විසින් අදාල නෞකාවේ හිමිකරුවන් වෙතින් අයකරගන්නා ලෙස දක්වා තිබුණද මේ වනතෙක් ඒ සඳහා දරන ලද රු. 11,551,133 ක් වූ මුළු වියදම අයකර නොතිබුණි. තවද වර්ෂ 02 ක කාලයක් ගතවුවද සමුද්‍ර දූෂණ පනතේ 26 වන වගන්තිය ප්‍රකාරව එම නැවෙන් සිදුවූ සමුද්‍ර දූෂණයට අදාලව වන්දි අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) 2010 නොවැම්බර් 13 දින කොළඹ වරායේදී තෙල් කාන්දුවීමක් සිදුවූ MT Chahat නැවෙන් පරිසර හානිය සිදුවී වර්ෂ 03 ක කාලයක් ගතවී තිබුණද ඊට අදාල වන්දි අයකරගෙන නොතිබුණි.

(ඇ) සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 51(4) වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකිරීමෙන් පසු හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරනු ලැබිය යුතු වුවත් ගැසට් පත්‍ර 02 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) සමුද්‍ර දූෂණය වැළැක්වීම දැනුවත් කිරීමේ අරමුණින් දැනුවත්කිරීමේ වැඩසටහන් සඳහා 2011 වර්ෂයේ සිට රු. 6,507,297 ක් වැයකර තිබුණද සමුද්‍ර පරිසර දූෂණය වීම වර්ධනය වෙමින් පවතින බැවින් මෙම වැඩ මුළු පැවැත්වීම තුළින් සමුද්‍ර දූෂණය වැළැක්වීමට ලැබෙන දායකත්වය විගණනයට තහවුරු නොවීය.

(ඉ) "නැව් මඟින් ඉවතලන බැලස් ජලය ඔස්සේ ආගන්තුක ආක්‍රමණ ජීවීන් ශ්‍රී ලංකා සාගර කලාපයට හඳුන්වාදීම කළමනාකරණය සඳහා වූ ව්‍යාපෘතිය මඟින් (Management of Introduction of Invasive Alien Species into Sri Lanka waters through ship's Ballast water) සැලැස්මේ

ඇතුළත් ආගන්තුක ආක්‍රමණ කාරී ජීවීන් පැමිණීමේ අවදානම එක් එක් වරාය මට්ටමින් ඇගයීම සැලසුම් කිරීමේ (Risk of alien invasive species introduction through ballast is assessed in each Commercial port) ක්‍රියාකාරකම සඳහා රු. 3,000,000 ක් වෙන්කර තිබුණද එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

අධිකාරිය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ දැනට භාවිතා වන මහල් වලට අමතරව 2013 දෙසැම්බර් මාසයේ සිට අතිරේක මහල් 02 ක් මසකට රු.240,000 කට කුලියට ගෙන 2014 අප්‍රේල් දක්වා රු. 1,200,000 ක වියදමක් දරා තිබුණි. නමුත් 2014 අප්‍රේල් දක්වා එම මහල් 02 ක භාවිතයට ගෙන නොතිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්**

**----------------------------------------------------------------**

වරාය ආශ්‍රිතව මූලික දත්ත පද්ධතියක් ඇති කිරීමේ සමීක්ෂණයක් සඳහා රු.873,750 ක් වටිනා අන්වීක්ෂ කැමරාවක් (Microscope Camera) මිලදීගෙන තිබුණු නමුත් අධිකාරියේ රසායනාගාරයේ ඉඩපහසුකම් නොමැති වීම නිසා එම සමීක්ෂණය සඳහා සහභාගි වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකුගේ ඉල්ලීම මත අදාල කැමරාව එම විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කිරීමට භාරදී තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩලය 183 ක් වූ අතර තථ්‍ය කාර්යමණ්ඩලය 110 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 73 ක් විය.

(ආ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ පනතේ 16 ඡේදයේ (2) වගන්තිය අනුව අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා, සාමාන්‍යාධිකාරීවරයා වුවත් ස්ථිර නිලධාරියෙකු එම තනතුර සඳහා පත් නොකර කළමනාකරු (නීති) නිලධාරීනිය එම තනතුරේ වැඩ ආවරණය කිරීමට පත්කර තිබුණි. එසේම ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 07 ක් ද පුරප්පාඩු වී පැවතීම අධිකාරියේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු වලට බාධාවක් වී තිබුණි.

(ඇ) නිලධාරීන්ගේ බඳවාගැනීමේදී අධ්‍යාපන සුදුසුකම් වල නිවැරදිතාවය අදාල ආයතන වලින් තහවුරු කරගෙන නොතිබුණි.

(ඈ) සමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්), ලේකම්, සහකාර කළමනාකරු, සැලසුම් සහ සහකාර කළමනාකරු නීති යන තනතුරු වලට බඳවා ගැනීම් සඳහා පුවත්පත් දැන්වීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 303,744 ක මුදලක් වියදම්කර තිබුනද මෙම බඳවාගැනීම් 2014 අගෝස්තු දක්වාම සිදුකර නොතිබුණි.

**05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**--------------------------------------**

**5.1 පනතේ අරමුණු ඉටු නොවීම**

**------------------------------**

සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ 51 (1) වගන්තිය යටතේ නියම කර ඇති නියෝගයන් 07 ක් සම්බන්ධ නීති හා විධිවිධාන කෙටුම්පත් සකස්කර, සමුද්‍ර දූෂණය අවමකර ගැනීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි.

**5.2 විගණන කමිටු**

**------------------**

විගණන කමිටු රැස්වීම් වලදී ගන්නා ලද පහත සඳහන් තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) ධීවර වරායන් හී පවතින අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළයුතු බවට තීරණය කළද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මුහුදු සීමාවේ සිට මීටර් 300 ක් ගොඩබිම දක්වා වූ සීමාවේ මුහුදට අපද්‍රව්‍ය බැහැරවන ආකාරයෙන් තනා ඇති වැසිකිළි හා අපද්‍රව්‍ය යලි ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දැමීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කිරීමටත්, ප්‍රතිචක්‍රීයකරනය නොකර මුහුදට දමන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් සංචාරක කර්මාන්තයට විශේෂ බලපෑමක් විය හැකි බැවින් එම ගැටළුව සම්බන්ධව සංචාරක සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කොට ඉදිරියේදී ක්‍රියාකළ හැකි ආකාරය පිළිබඳව වාර්තාවක් සකස් කිරීමටත් තීරණය කළද එය ඉටුකර නොතිබුණි.

(ඇ) විද්‍යාගාර කටයුතු වඩා සාර්ථකව හා ඵලදායීව පවත්වාගෙන යාම සඳහා දැනට ඒ සඳහා ඇති පරීක්ෂණ පුළුල් කිරීම හා විද්‍යාගාරයෙන් සිදුකරන ලද සමස්ථ පරීක්ෂණවල වාර්තාවක් (Feacal Colifoam, Total Colifoam යනාදිය ඇතුළත් කරමින්) සකස් කිරීම ප්‍රමාදවී තිබුණි.

**5.4 නොවිසඳී ඇති විගණන ඡේද**

**-------------------------------**

සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත අනුව සමුද්‍රීය පරිසර සභාව පිහිටුවීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

**06. පද්ධති හා පාලනයන්**

**-----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අයවැය පාලනය.

(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය

(ඇ) ව්‍යාපෘති පරිපාලනය.

(ඈ) සැලසුම් සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම.